සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

23 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

## Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

## දේශපාලන විද්‍යාව I

කාලය පැය දෙකයි

- 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1,2,3,4,5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන ලකුණු කරන්න.
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

❖ **අංක 1-26 තෙක් ප්‍රශ්න සඳහා ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දක්වා ඇත. සත්‍ය ප්‍රකාශ කණ්ඩය තෝරන්න.**

01. දේශපාලන විද්‍යාව,

A දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හදාරන විෂය යි.
B දේශපාලනය දීර්ඝ කාලයක සිට හදාරයි.
C අතීතයේ දී ශාස්ත්‍රාලයන් තුළ අධ්‍යයනය කරන ලදී.
D ස්වභාවික විද්‍යාවන් සමඟ සමීපව සම්බන්ධ වෙයි.
E වර්තමානයේත් ශාස්ත්‍රාලයන් තුළ අධ්‍යයනය කරනු ලබයි.

1. ABCD  2. BCDE  3. ABCE  4. ABDE  5.ACDE

02. දේශපාලනය හැදෑරීමට

A දේශපාලනයේ විවිධ පැතිකඩ ඇතුලත් වෙයි.
B දේශපාලනය ගැන පර්යේෂණ ඇතුළත් වෙයි.
C අයත්වන්නේ පැරණි න්‍යායන් පමණි.
D දේශපාලන ප්‍රතිපත්ති විචාරය ද අයත් වෙයි.
E නව න්‍යායන් හා විකල්ප ගොඩනැංවීම ද ඇතුලත් වෙයි.

1. ABCD  2. BCDE  3. ABDE  4. ABCE  5.ACDE

03. දේශපාලන විද්‍යාවේ විශේෂ ලක්ෂණයක් වන්නේ,

A ශාස්ත්‍රීය විෂයන් ගණනාවක් සමඟ ආරම්භ වීමයි.
B සෑම යුගයකම සමාන විෂය ක්ෂේත්‍රයක් පැවතීමයි.
C විවිධ යුගවල විවිධ ප්‍රවේශ පැවතීමයි.
D ආචාර විද්‍යාත්මක අදහස් මුල් යුගවල පැවතීමයි.
E සමකාලීනව විද්‍යාත්මක සමාජයීය විද්‍යාවක් වීමයි.

1. ABCD  2. BCDE  3. ABCE  4. ABDE  5.ACDE

04. දේශපාලනය,

A සරළව ගත් විට දේශපාලනය ගැන ඉගෙනීමයි.

B දේශය පාලනය කිරීම යන අර්ථයට සමාන වෙයි.

C පුළුල්ව ගත්විට ආණ්ඩුකරණ ක්‍රියාවලියයි.

D පුරවැසියන්ගේ සමාජ භාවිතය යි.

E සෑම තැනකම පවතින ක්‍රියාවලියකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

05. දේශපාලනයට,

A ග්‍රීක යුගයේ දී පෞර රාජ්‍ය කටයුතු ඇතුලත් විය.

B අධිරාජ්‍ය කටයුතු රෝම යුගයේ දී ඇතුළත් විය.

C ජාතික රාජ්‍ය කටයුතු මධ්‍යතන යුගයේදී ඇතුලත් විය.

D නූතන යුගයේ දී කාර්ය භාරයේ වැඩි වීමක් දැකිය හැකි විය.

E බලය හා බල අරගලය ඇතුලත් වී ඇත.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

06. දේශාපාලනය කිරීම,

A ඡන්දයෙන් හා උණ්ඩයෙන් සිදු කරයි.

B කළ හැක්කේ මැතිවරණ වලින් පමණි.

C සඳහා පක්ෂ වල වැඩ කිරීම ද ඇතුළත් ය.

D සඳහා දේශපාලනය ඉගෙන ගත යුතුම නැත.

E පුරවැසි ක්‍රියාවලියකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

07. දේශපාලනය හැදෑරීම.

A සඳහා දේශපාලනය කිරීම අනිවාර්ය නැත.

B විධිමත් හා අවිධිමත් ආකාරයට කළ හැක.

C අවිධිමත්ව කළ විට අපක්ෂපාතී අවබෝධයක් ලැබේ.

D ශාස්ත්‍රීය ලෙස කළ විට පුළුල් අවබෝධයක් ලැබේ.

E ප්‍රතිමානිය - සදාචාරවාදී දේශපාලනයක් සඳහා බලපානු ලබයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

08. දේශපාලන ආයතනවලට,

A රාජ්‍ය අයත්වන්නේ එය ආයතනගතවීම නිසාය.

B ආණ්ඩුව ද ඇතුලත් ය.

C දේශපාලන පක්ෂ ද අයත්වෙයි.

D පළාත් ආණ්ඩු ද අයත්වෙයි.

E දේශපාලන සාහිත්‍යයද ඇතුළත් ය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

09. පාර්ලිමේන්තු ආයතනයක භාවිතය සඳහා,

A සාධාරණ මැතිවරණ අවශ්‍ය විය.

B ආණ්ඩුව සුළුතරය මත පදනම් විය යුතුය.

C මහජන පරමාධිපත්‍යය පැවතිය යුතුය.

D පරිපාලන රෙගුලාසි අවශ්‍ය ය.

E ද්වි හෝ බහු පක්ෂ ක්‍රමයක් අවශ්‍ය ය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

10. ප්‍රායෝගික ආණ්ඩුකරණය සඳහා,

A විධිමත් නීති රීති පද්ධතියක් අවශ්‍ය වෙයි. B ආණ්ඩුබලය මධ්‍යගත කිරීම අවශ්‍ය වෙයි.

C රටේ නීතිය හා සාමය පවත්වාගත යුතු වෙයි. D සමාජ ගැටුම් කළමනාකරණය කළ යුතු වෙයි.

E රාජ්‍ය ප්‍රතිපත්ති කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු වෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

11. දේශපාලන චර්යාව,

A දේශපාලන අධ්‍යයනයේ මූලික ක්ෂේත්‍රයකි.

B නූතන ආණ්ඩුකරණයේ පුරවැසි ක්‍රියාකාරීත්වය යි.

C දේශපාලන සහභාගිත්වයට බලපානු ලබයි.

D සක්‍රීය පුරවැසිභාවය මැනීමට යෙදිය නොහැකිය.

E ප්‍රචණ්ඩ වීමට ද අවකාශ තිබේ.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

12. දේශපාලන මතවාද,

A රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී සැළකිල්ලට නොගනියි.

B පුරවැසි දේශපාලන චර්යාව හැඩගස්වනු ලබයි.

C පුරවැසි විඥානය නිර්මාණය කරයි.

D මිනිසුන් අතර ප්‍රතිවිරෝධතා ගොඩනැංවීමට බලපානු ඇත.

E පක්ෂවල ප්‍රතිපත්ති ගොඩනැංවීමට බලපානු ලබයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

13. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශයක් යනු,

A දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය විග්‍රහ කරනු ලබන විධි ක්‍රමයකි.

B රාජ්‍ය ගැන සකස් කළ න්‍යාය පද්ධතියකි.

C දේශපාලනය හදාරනු ලබන ආකෘතියකි.

D දේශපාලන ප්‍රපංච හඳුනාගනු ලබන දෘෂ්ටිවේදයකි.

E දේශපාලනය ශාස්ත්‍රිය ලෙස හැදෑරීමට යොදා ගන්නා විග්‍රහ විධියකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

14. දාර්ශනික ප්‍රවේශය,

A ප්‍රතිමානීය නිෂ්ඨාවන් ඉලක්ක කර ගනියි. B සාම්ප්‍රදායිකව යොදා ගනු ලබන ප්‍රවේශයකි.

C සංකල්ප වලට අර්ථ ලබාදෙයි. D විවිධ වූ තර්ක විධි ක්‍රම භාවිතා කරයි.

E වඩා යතාර්ථවාදී විග්‍රහ ක්‍රමයකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

15. තුලනාත්මක ප්‍රවේශය,

A ඇරිස්ටෝටල් ආණ්ඩු ක්‍රම අධ්‍යයනයට යෙදවීය. B විසිවන සියවසේ දී ආචාර විද්‍යාත්මක විය.

C විසිවන සියවසේදී විද්‍යාත්මක විය. D වඩා යථාර්ථවාදී දේශපාලන අධ්‍යයන ක්‍රමයකි.

E වර්තමානයේ දී සිය විෂය ක්ෂේත්‍රය නම්‍යශීලී කරගෙන ඇත.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

16. බහු විෂයික ප්‍රවේශය

A වෙනත් විෂයන්වල විධික්‍රම දේශපාලන අධ්‍යයනයට යොදවා ගනියි.

B අවශය වන්නේ දේශපාලනය බොහෝ ක්ෂේත්‍ර සමඟ සම්බන්ධ වන නිසාය.

C අවශ්‍ය වන්නේ දේශපාලනය වියුක්තව පවතින නිසාය.

D වර්ධනය වන්නේ අතීතයේ පටන්ම දේශපාලනය අධ්‍යයනය වෙනත් විෂයන් සමඟ බද්ධ වූ නිසා ය.

E අවශ්‍ය වන්නේ දේශපාලන වෙනස්වීම් සඳහා සමාජයේ විවිධ පැතිකඩ බලපාන නිසාය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

17. අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය,

A කාල්මාක්ස්ගේ බලපෑම ලද ප්‍රවේශයකි.

B වර්ධනය කිරීමට මැක්ස්වෙබර් බලපාන ලදී.

C ආර්ථික සාධකයට මූලිකත්වයක් දෙයි.

D වඩා යථාර්ථවාදී ප්‍රවේශයකි.

E දේශපාලනයේ සියළු සමාජ සාධක සළකා බලයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

18. විද්‍යාත්මක චර්යාවාදය,

A ආනුභවික විධික්‍රමය යොදවා ගනියි.

B ප්‍රත්‍යක්ෂමූලික දැනුම මත පදනම් වෙයි.

C මනෝරාජික සංජානන මත පදනම් වෙයි.

D පුද්ගලචර්යාව විධිමත්ව අධ්‍යයනය කරයි.

E සිය අධ්‍යයන ක්ෂේත්‍රය සීමා කළේය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

19. සමාජ විද්‍යාත්මක ක්‍රමය,

A සමාජයේ දාර්ශනික අංශය සොයා බලයි.

B සමාජයේ විවිධ පැතිකඩ අධ්‍යයනය කරයි.

C දේශපාලනයේ සමාජ සාධක සොයා බලයි.

D සමාජ සමීක්ෂණ මත දත්ත සපයාගනියි.

E නියැදි අධ්‍යයනය මඟින් දත්ත සොයා ගනියි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

20. ස්ත්‍රීවාදය,

A නූතන රැඩිකල් ප්‍රවේශයකි.

B පුරුෂ ආධිපත්‍යය ප්‍රශ්න කරයි.

C ස්ත්‍රී පීඩනය ඉල්ලා සිටියි.

D සාහිත්‍ය ප්‍රවේශයක් ද වෙයි.

E ස්ත්‍රි විමුක්තිය උදෙසා වෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

21. න්‍යාය,

A දේශපාලන ප්‍රපංච අවබෝධ කරගැනීමට යොදවා ගනියි.

B ප්‍රතිමානිය හා ප්‍රත්‍යක්ෂ මූලික ලෙස බෙදෙයි.

C හැමවිටම උපකල්පන හා මනෝරාජික ආකෘති මත පදනම් වෙයි.

D විද්‍යාත්මක වන විට ලබන දැනීම යථාර්ථවාදී වෙයි.

E දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය වර්ධනය කරයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

22. රාජ්‍යය දේශපාලන ආයතනයක් වන්නේ,

A එය මනාව සංවිධානය වී ඇති නිසාය.
B න්‍යායිකව විග්‍රහ කළ නොහැකි සංකල්පයක් නිසාය.
C ඊට නෛතික ව්‍යුහයක් ඇති නිසාය.
D විධිමත් හා ස්ථාවර වන නිසාය.
E අනෙකුත් ආයතන අතර කේන්ද්‍රීය ආයතනයක් වන නිසාය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

23. ආණ්ඩුව,

A හැමවිටම ප්‍රජාතන්ත්‍රවාදී වෙයි.
B රාජ්‍ය බලය මෙහෙයවයි.
C රාජ්‍ය වෙනුවෙන් නියෝජනය කරයි.
D රාජ්‍යයේ ගමන් දිශාව තීරණය කරයි.
E මතවාදී හා මර්ධන බලය භාවිතා කරයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

24. දේශපාලන පක්ෂ,

A රාජ්‍ය බලය උදෙසාය.
B රාජ්‍ය තරමටම ඓතිහාසිකය.
C කේඩර හා ජනතාවාදී ලෙස වර්ග වෙයි.
D මහජන මතය නියෝජනය කරයි.
E දේශපාලන ප්‍රභූන් නිර්මාණය කරයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

25. බලපෑම් කණ්ඩායම්,

A රාජ්‍ය බලය ලබාගැනීම වෙනුවෙනි.
B අභිලාශ නියෝජනය කරයි.
C රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණයට බලපෑම් කරයි.
D ලොබී කණ්ඩායම් ලෙස ද කටයුතු කරයි.
E ප්‍රජාතන්ත්‍රවාදය පෝෂණය කරයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

26. සිවිල් සමාජය,

A ශක්තිමත් වීම පුරවැසි අයිතීන් වර්ධනයට බලපානු ලබයි.
B දුර්වල වීම ප්‍රජාතන්ත්‍රවාදයට යහපත් ය.
C සම්භාව්‍ය ලිබරල් අර්ථයෙන් ගත්විට ධනවාදී වෙළඳපොල අවකාශය යි.
D මූලික මාක්ස්වාදී අර්ථයෙන් ගත්විට ධනවාදී සමාජයයි.
E වර්තමානයේ සංවිධිත දේශපාලන සමාජය ලෙස අර්ථවත්වෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

❖ **අංක 27 - 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් එකක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය කුමක්දැයි දක්වන්න.**

27. රාජ්‍යය,

1. දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය සංකල්පය යි.
2. න්‍යායිකව සමානව අර්ථ දක්වයි.
3. ඓතිහාසිකව විකාශනය වෙයි.
4. ප්‍රායෝගිකව දේශපාලන බලයේ ප්‍රකාශනයකි.
5. සමාජයේ බලවත්ම සංවිධානය වෙයි.

28. රාජ්‍යයේ කාර්යභාරය,

1. ආණ්ඩුවේ කාර්යභාරයට සමපාත වෙයි.
2. ග්‍රීක යුගයේ දී උපරිම විය.
3. 20 වන සියවසේ දී සීමිත විය.
4. ආරක්ෂාව හා ප්‍රගතිය යි.
5. සමාජ පාලනය හා මෙයෙවීමයි.

29. රාජ්‍ය උත්තරීතර වන්නේ,

1. ස්වාධිපති බලයේ හිමිකරුවා වන නිසාය.
2. සමාජ යහපතේ භාරකරුවා වන නිසාය.
3. සන්නද්ධ ප්‍රචණ්ඩත්වයේ හිමිකරුවා වන නිසාය.
4. ජාතිය හා රාජ්‍ය සමාන වන නිසාය.
5. සංවිධානය වූ බලය නිසාය.

30. ග්‍රීක පෞර රාජ්‍ය,

1. මධ්‍යධරණී වෙරළ ආශ්‍රිතව පැවතුණි.
2. කුඩා නාගරික රාජ්‍ය රටාවකි.
3. වැඩවසම් සමාජය මත ගොඩනැගුණි
4. ක්‍රිස්තු පූර්ව යුගයේ පැවතුණි.
5. බටහිර මුල්ම සංවිධිත රාජ්‍යයයි.

31. වැඩවසම් ක්‍රමය,

1. මුදල් වෙළෙඳපොළ ක්‍රමය මත පදනම් විය.
2. සරල ස්වයංපෝෂිත ක්‍රමයකි.
3. බාටාන් අර්ථිකයක් තුළ ක්‍රියාත්මක විය.
4. මුල දී රජු - පල්ලිය හා රදළයින් අතර බලය බෙදාගත් ක්‍රමයකි.
5. පුරවැසියා වෙනුවට යටත් වැසියෙකු පවත්වාගත්තේය.

32. නූතන ජාතික රාජ්‍ය ගොඩනැංවීමට,

1. ධනවාදය බලපාන ලදී.
2. වර්ගවාදය බලපාන ලදී.
3. නිශ්චිත ලෙසම ජාතිකවාදය බලපෑවේය
4. මිලිටරි බලය යොදා ගත්තේය.
5. එක් ජාතියක් එක් රාජ්‍යයක් යන සමීකරණය බලපෑවේය.

33. ගෝලීයකරණය,

1. කාල් මාක්ස්ට අනුව ධනවාදයේම ප්‍රකාශනයකි.
2. ආර්ථිකය ජාත්‍යන්තරීකරණය වීමකි.
3. වැඩවසම් යුගයේ පටන් ප්‍රචලිත සංකල්පයකි.
4. වර්තමානයේ විශ්ව සංස්කෘතියක් බිහිකරමින් සිටියි.
5. ජාතික රාජ්‍යයේ දේශසීමා අභිබවමින් ක්‍රියාත්මක වෙයි.

34. ලිබරල් රාජ්‍ය,

1. අධිපතිවාදී රාජ්‍ය රටාවකි.
2. ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකි.
3. මහජන පරමාධිපත්‍ය අගය කරන්නකි.
4. ව්‍යවස්ථානුකූලවාදය ක්‍රියාවට නංවන්නකි.
5. ජනතා නිදහස අගය කරන්නකි.

35. සමාජවාදී රාජ්‍ය,

1. ලිබරල් විරෝධී රාජ්‍ය ආකෘතියකි.
2. රුසියානු විප්ලවයෙන් පසුව බිහිවූවකි.
3. නිර්ධන පන්ති අඥාදායකත්වය මත පදනම වෙයි.
4. නිදහස් මැතිවරණ ක්‍රමය පිළිගනියි.
5. වර්තමානයේ දුර්වල වෙමින් පවතියි.

36. ෆැසිස්ට් රාජ්‍ය,

1. නියට්ෂේගේ 'සුපිරි මිනිසා' යන සංකල්පය ප්‍රබල ලෙස යොදා ගනියි.
2. බලය දුර්වල කිරීම වෙනුවෙන් පෙනී සිටියි.
3. මුල්වරට ගොඩනගන්නේ බෙනිටෝ මුසෝලිනී විසිනි.
4. ජාතියේ බලය ගොඩනැංවීම වෙනුවෙන් පෙනී සිටියි.
5. සන්නද්ධ බලය පදනම ලෙස යොදා ගනියි.

37. යටත් විජිත රාජ්‍ය,

1. භූමියෙන් විශාලය
2. අධිරාජ්‍යවාදය සමඟ බැඳී පවතියි.
3. පරිපූර්ණ ස්වාධිපති කුඩා රාජ්‍යයකි.
4. මිලිටරි රාජ්‍යයක් ලෙස වර්ධනය විය.
5. මධ්‍යගත රාජ්‍ය තන්ත්‍රයකි.

38. පශ්චාත් යටත් විජිත රාජ්‍ය,

1. න්‍යායික ලෙස විග්‍රහ කළේ හම්සා අලාවි විසිනි.
2. සියල්ල ප්‍රජාතන්ත්‍රවාදී වෙයි.
3. සිවිල් මිල්ටරි නිලධර තන්ත්‍රයේ ආධිපත්‍ය මත පදනම් වෙයි.
4. නිතර හමුදා කුමන්ත්‍රණවලට නතු වෙයි.
5. යටත් විජිත රාජ්‍ය ව්‍යුහයම ඉදිරියට ගෙන යයි.

39. නව ලිබරල් රාජ්‍යය,

1. සුභසාධක වාදය සීමා කරයි.
2. අවම රාජ්‍යයකි.
3. උපරිම ආධිපතිවාදී වෙයි.
4. ලෝක ප්‍රාග්ධන කොන්දේසි වල බලපෑමට යටත්ය.
5. දේශපාලන වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදීය.

40. ස්වාධිපත්‍ය,

1. ජාතික රාජ්‍යයේ පදනම් සංකල්පය යි.
2. අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදෙයි.
3. ප්‍රායෝගිකව බෙදීමටත් පැවරීමටත් ලක්වෙයි.
4. න්‍යායිකව උත්තරීතර වෙයි.
5. කිසිදු ජාත්‍යන්තර බලවේගයකට පාලනය කළ නොහැකිය.

❖ **අංක 41 සිට 50 දක්වා ප්‍රශ්නයේ ආකෘතියට උචිත පරිදි පිළිතුර තෝරන්න.**

41. පුරවැසියා සම්බන්ධ වඩාත් නිවැරදි පිළිතුර කුමක්ද?

1. ඇරිස්ටෝටල් අනුව පෞර රාජ්‍යයේ සියළු දෙනා පුරවැසියෝය.
2. යටත් වැසියාට පුරවැසියා සමාන වෙයි.
3. පුරවැසියාට රාජ්‍ය කාර්යභාරයක් නැත.
4. රාජ්‍යයට පුරවැසියා අවනත විය යුතු නැත.
5. නූතන පුරවැසියා සක්‍රීය සිවිල් සමාජ චරිතයක් විය යුතුය.

42. පාලන තන්ත්‍රය සම්බන්ධ නිරවුල් ප්‍රකාශ කාණ්ඩය,

A ආණ්ඩුවට තරමක් සමාන සංකල්පයකි.
B අධිපති නායකයෙක් විසින් මෙයෙවන පාලනයකි.
C මතවාද අනුව ආණ්ඩු හැඳින්වීමට ද යොදන සංකල්පයකි.
D විකල්ප නැති රෙජිමේන්තුකරණයකි.
E අතිශයින්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයන් හැඳින්වීමට යොදන සංකල්පයකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

43. ජෝන් ලොක් සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,

1. ඔහු ඉංග්‍රීසි ජාතික දර්ශනිකයෙකි.
2. ඔහුගේ ග්‍රන්ථය Leviathan ය.
3. ඔහු සීමිත බලයක් යෝජනා කළේය.
4. ඔහු පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අගය කළේය.
5. ඔහු ප්‍රජාතන්ත්‍රවාදයට වැදගත් විය.

44. තෝමස් ගොබ්ස් සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. ඔහු ඉංග්‍රීසි චින්තකයෙකි.
2. ඔහු අදහස් දක්වන්නේ ඉංග්‍රීසි විප්ලවයට පසුවය.
3. ඔහු අසීමිත බලයක් යෝජනා කරයි.
4. ඔහු මිනිසා විග්‍රහ කළේ සර්ව අසුභවාදීවයි.
5. ඔහුගේ ග්‍රන්ථය Leviathan විය.

45. කාල් මාක්ස් සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

1. කාල් මාක්ස් විද්‍යාත්මක සමාජවාදියකි. 2. කාල්මාක්ස් ජර්මන් ජාතිකයෙකි.
3. ඔහුගේ දේශපාලන ග්‍රන්ථය කොමියුනිස්ට් ප්‍රකාශනය යි. 4. ඔහු මනෝරාජික සමාජවාදියෙකි.
5. මාක්ස්ගේ සමකාලීනයා ෆෙඩ්‍රික් එංගල්ස්ය.

46. සමාජ ගිවිසුම්වාදයට අනුව නිරවුල් ප්‍රකාශ කාණ්ඩය කුමක්දැයි දක්වන්න.

A තෝමස් හොබ්ස් සීමිත බලැති පාලකයෙකු වෙනුවෙන් සමාජ ගිවිසුම යොදවා ගත්තේය.
B ජෝන් ලොක් ගිවිසුමෙන් නිර්මාණය කළේ වගකීම් සහිත පාලකයෙකි.
C සැම චින්තකයෙක්ම සමාජය ප්‍රකෘති හා සිවිල් වශයෙන් බෙදා දක්වන ලදී.
D ජීන් ජැක් රූසෝ මහජන පරමාධිපත්‍යයක් වෙනුවෙන් සම්මුතිය යොදා ගන්නා ලදී.
E සමාජය හා රාජ්‍ය අතර සබඳතාවය මුල්වරට පැහැදිළි කළේ සම්මුතිවාදය මඟිනි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

47. මාක්ස්වාදය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක්දැයි දක්වන්න.

1. 19 වන සියවසේ ඇතිවූ නිර්ධන පන්තියේ විමුක්ති දර්ශනය මාක්ස්වාදයයි.
2. මාක්ස්වාදයට අනුව නිර්ධන පන්තියේ ගාමක බලවේගය කොමියුනිස්ට් පක්ෂයයි.
3. සමස්ථ සමාජ ඉතිහාසය පන්ති අරගලයේ ඉතිහාසය බව මාක්ස්වාදයේ අදහසයි.
4. රාජ්‍ය පන්ති සමාදානයේ උපකරණය බව මාක්ස්ගේ අදහසයි.
5. මාක්ස්වාදය මූලික වශයෙන් ආර්ථික නියතිවාදයකි.

48. ලිබරල්වාදය සම්බන්ධ වඩා නිරවුල් ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.

A සම්භාව්‍ය ලිබරල්වාදය රාජ්‍ය උපරිම කාර්යභාරයක් වෙත යොමුකරන ලදී.
B සුබසාධන රාජ්‍ය සංකල්පය පැමිණියේ නූතන ලිබරල්වාදය තුළය.
C නව ලිබරල්වාදය අවම රාජ්‍ය සංකල්පය පිළිගත්තේය.
D ලිබරල්වාදය ධනේෂ්වර ක්‍රමයේ දේශපාලන න්‍යායයි.
E ලිබරල්වාදය වෙනස්වන සමාජ තත්ත්වයන්ට අනුගත වන ගතික න්‍යායකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

49. චින්තකයින් සම්බන්ධ නිරවුල් ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.

A සොක්‍රටීස් ප්ලේටෝ - ඇරිස්ටෝටල් ග්‍රීක චින්තකයින් විය.
B නූතන යුගයේ ආරම්භක චින්තකයා නිකොලොයි මැකියාවෙලීය.
C අන්තෝනියෝ ග්‍රාම්ස්චි සහ ලුවී අල්ෂයර් නව මක්ස්වාදීන් ය.
D ජෝන් රෝල්ස් හා රොබට් නොසික් නව ලිබරල් චින්තකයින් ය.
E ශාන්ත ඔගස්තීනු හා තෝමස් ඇක්වයිනාස් රෝම චින්තකයෝය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

50. සමස්ත දේශපාලන න්‍යාය හා භාවිතය සම්බන්ධ වඩා නිරවුල් ප්‍රකාශය කුමක්දැයි දක්වන්න.

1. ප්‍රතිමානීය න්‍යායන් බොහොමයක් ප්‍රයෝගික භාවිතයෙන් තොරය.
2. විද්‍යාත්මක න්‍යාය සැම දේශපාලන සංල්පයක් ආශ්‍රිතව ම ගොඩනැංවිය හැකිය.
3. ප්‍රත්‍යක්ෂමූලික දත්තයන් පමණක් දේශපාලන දර්ශනයේ දී යොදා ගනී.
4. සැම දාර්ශනිකයෙක්ම එකම විකල්ප ආකෘතියක් ගොඩනංවා ඇත.
5. ස්ත්‍රි පුරුෂ විභේදනයත් ස්ත්‍රී පීඩනයත් යන දෙකම ජීව විද්‍යාත්මකය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 23 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................. දේශපාලන විද්‍යාව II කාලය පැය තුනයි

- **1 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. සම්පූර්ණ පිළිතුරකට ලකුණු 1ක් ද, අර්ධ පිළිතුරකට ලකුණු 1/2 ක් ද හිමි වේ.**
- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. එක් ප්‍රධාන ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ.**

## A කොටස

**මෙහි කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. ක්‍රිස්තු පූර්ව යුගයේ බටහිර දේශපාලන චින්තනයේ ප්‍රධාන දාර්ශනිකයින් තිදෙනෙකි. ඔවුන්ගෙන් දෙදෙනෙකු දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

02. දේශපාලනය කිරීම දේශපාලනයේ ප්‍රායෝගික පුරුවැසි ක්‍රියාවලියකි. මිනිසුන් දේශපාලනය කරන ආකාර දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

03. දේශපාලනය ගැන ශාස්ත්‍රීය අධ්‍යයනයේදී අවධානය යොමු කරන ක්ෂෙත්‍ර ගණනාවකි. ඒවායින් දෙකක් ලියා දක්වන්න.

1. .......................................................................... 2. ..........................................................................

04. දාර්ශනික ප්‍රවේශයේ මූලික ලක්ෂණයක් වන්නේ අතිමූලික ලෙස දේශපාලනය ප්‍රශ්න කිරීමයි. දේශපාලනය ගැන එසේ මතු කළ හැකි ප්‍රශ්න දෙකක් ලියන්න.

1. .......................................................................... 2. ..........................................................................

05. විද්‍යාත්මක ප්‍රවේශයේ මූලික ලක්ෂණ දෙකක් දක්වන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

06. ස්ත්‍රීවාදය විසින් දේශපාලන විද්‍යාවට එකතු කළ නව න්‍යායික සංකල්ප දෙකක් දක්වන්න.
1. ..........................................................................................................................................................
2. ..........................................................................................................................................................

07. මධ්‍යකාලීන යුගයේ ප්‍රධාන චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

08. වර්තමානයේ දේශපාලන පක්ෂවල හැසිරීමට බලපාන ලද ප්‍රධාන මතවාද දෙකක් දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

09. ලෝකයේ දැනට ක්‍රියාත්මක වන
1. ප්‍රධාන තනි පක්ෂ ක්‍රමය සහිත රාජ්‍යයක් ..........................................................................................
2. ප්‍රධාන ද්වි පක්ෂ ක්‍රමය සහිත රාජ්‍යයක් ..........................................................................................
ලියා දක්වන්න.

10. බලපෑම් කණ්ඩායම් කිහිප ආකාරයකට වර්ග කර තිබේ. ඒවායින් මූලික බලපෑම් කණ්ඩායම් වර්ග 02ක් දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

11. රාජ්‍යයක් විසින් ඉෂ්ට කරනු ලබන මූලික කාර්යයන් දෙකක් දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

12. රාජ්‍ය සම්බන්ධ මූලික අර්තකථන ගණනාවකි. පහත චින්තකයින් දෙදෙනාගේ රාජ්‍ය පිළිබඳ නිර්වචන 02 කුමක්ද?

1. ඇරිස්ටෝටල් - ..............................................................................................................................
2. මැක්ස් වෙබර් - ..............................................................................................................................

13. නූතන ජාතික රාජ්‍යයේ මූලික අංග ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.
1. ............................................................................................ 2. ..........................................................................................

14. පහත සඳහන් සමාජ ක්‍රම දෙකේ ආර්ථිකයන් හඳුන්වන්න.
1. වැඩවසම් ක්‍රමය - ..............................................................................................................................
2. ධනවාදී ක්‍රමය - ..............................................................................................................................

15. ලිබරල් රාජ්‍යයේ දේශපාලන ලක්ෂණ දෙකක් දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

16. පශ්චාත් යටත් විජිත රාජ්‍ය වල මූලික ලක්ෂණ දෙකක් දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

17. ස්වාධිපත්‍යයේ ප්‍රධාන පැතිකඩ දෙකකි. එම පැතිකඩ දෙක ලියා දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

18. සාමාජ ගිවිසුම්වාදයේ චින්තකයින් තිදෙනෙකි. එයින් දෙදෙනෙකු හඳුන්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

19. මාක්ස්වාදී රාජ්‍ය මතය තුළ රාජ්‍ය නොමැති සමාජ ක්‍රම දෙකකි. ඒ දෙක දක්වන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

20. 1. ලෝකයේ ප්‍රධාන ෆැසිස්ට් නායකයින් දෙදෙනා නම් කරන්න.

1. ............................................................................................ 2. ..........................................................................................

**දේශපාලන විද්‍යාව**

**12 ශ්‍රේණිය - II කොටස**

## B කොටස

* **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.**

01. දේශපාලන අධ්‍යයනය වසර 2500ක පමණ දීර්ඝ ඉතිහාසයක් සහිත ක්‍රියාවලියකි. එය ග්‍රීක, රෝම, මධ්‍යතන හා නූතන යුගයන් ඔස්සේ වර්ධනය වූ ආකාරය දක්වන්න. (20)

02. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස ඉගෙනීමේදී අවධානය යොමු කරන ක්ෂේත්‍රයන් විස්තර කරන්න. (20)

03. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විස්තර කරන්න. (20)

04. තෝරාගත් අධ්‍යයන මාර්ග දෙකක් විස්තර කරන්න.
    1. දාර්ශනික
    2. චර්යාවාදී
    3. අර්ථශාස්ත්‍රීය
    4. තුලනාත්මක (10 x 2 = 20)

## C කොටස

05. රාජ්‍ය අර්ථ දක්වා රාජ්‍යයන් සතු කාර්යභාරය පිළිබඳ විමසීමක යෙදෙන්න. (20)

06. රාජ්‍ය පිලිබඳ සමාජ ගිවිසුම්වාදය හෝ මාක්ස්වාදී මතය විස්තරාත්මකව විමසන්න. (20)

07. පහත සඳහන් රාජ්‍ය ආකෘති වලින් දෙකක් විස්තර කරන්න.
    1. පශ්චාත් යටත් විජිත රාජ්‍ය
    2. නූතන ජාතික රාජ්‍ය
    3. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය
    4. සමාජවාදී රාජ්‍ය (10 x 2 = 20)

08. පහත සඳහන් දේශපාලන සංකල්ප 02ක් කෙටියෙන් අර්ථ දක්වන්න.
    1. රාජ්‍ය හා ස්වාධිපත්‍යය
    2. රාජ්‍ය හා පුරවැසියා
    3. රාජ්‍ය හා බලය
    4. රාජ්‍ය හා සිවිල් සමාජය
    5. රෙජීමය හෙවත් පාලන තන්ත්‍රය
    6. ගෝලීයකරණය හා ජාතික රාජ්‍යය (10 x 2 =20)

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018 - දේශපාලන විද්‍යාව

### පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. - 3 | 11. - 3 | 21. - 4 | 31. - 1 | 41. - 5 |
| 02. - 4 | 12. - 2 | 22. - 5 | 32. - 2 | 42. - 1 |
| 03. - 5 | 13. - 5 | 23. - 2 | 33. - 3 | 43. - 2 |
| 04. - 2 | 14. - 1 | 24. - 5 | 34. - 1 | 44. - 2 |
| 05. - 4 | 15. - 5 | 25. - 2 | 35. - 4 | 45. - 4 |
| 06. - 5 | 16. - 4 | 26. - 5 | 36. - 2 | 46. - 2 |
| 07. - 4 | 17. - 1 | 27. - 2 | 37. - 3 | 47. - 4 |
| 08. - 1 | 18. - 4 | 28. - 3 | 38. - 2 | 48. - 2 |
| 09. - 5 | 19. - 2 | 29. - 4 | 39. - 3 | 49. - 1 |
| 10. - 5 | 20. - 4 | 30. - 3 | 40. - 5 | 50. - 2 |

## දේශපාලන විද්‍යාව II පිළිතුරු

### A කොටස

01. (i) ප්ලේටෝ, (ii) ඇරිස්ටෝටල්
02. ඡන්දය දීම, පක්ෂවල වැඩ කිරීම, උද්ඝෝෂණය කිරීම, සන්නද්ධ ක්‍රියා
03. දේශපාලන දර්ශනය - දේශාලන න්‍යාය , දේශපාලන මතවාද - දේශපාලන ආයතන
    දේශපාලන භාවිතය - ආණ්ඩුකරණය
04. රාජ්‍ය යනු කුමක්ද? දේහපාලනය යනු කුමක්ද?, රාජ්‍ය බලයට අවනත වන්නේ ඇයි?
05. ප්‍රතිපත්‍යක්ෂ මූලික දැනුම භාවිතා කිරීම., සදාචාරාවාදී සංකල්ප යොදා ගැනීම
06. ස්ත්‍රී පීඩනය - පුරුෂ ආධිපත්‍යය, ස්ත්‍රි විමුක්තිය
07. ශාන්ත තෝමස් ඇක්වයිනාස්, ශාන්ත ඔගස්තීනු
08. සමාජවාදය - ලිබරල්වාදය, ෆැසිස්වාදය
09. 01 - චීනය, වියට්නාමය, උතුරු කොරියාව, කියුබාව
    02 - ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය
10. ආශා කණ්ඩායම් - බලපෑම් කණ්ඩායම් / ලොබී කණ්ඩායම් - සම්ප්‍රදායවාදී / ආයතනගත - ප්‍රවර්ධනකාරී, ආරක්ෂණවාදී
11. ජාතික ආරක්ෂාව, ජාතික සුභසාධනය
12. (i) රාජ්‍ය ස්වාභාව ධර්මය විසින් ගොඩනැංවූ සදාචාරමත් ආයතනයක් බව.
    (ii) රාජ්‍ය සංවිධානය වූ බලයයි.
13. නිශ්චිත භූමිය - ජාතික පදනම - ස්වාධිපත්‍යය - එක් ජාතින්ගේ එක් රාජ්‍යයක් වීම.
    මධ්‍යගත භාවය - නිලබල ක්‍රමය
14. (i) සරළ - ස්වයංපෝෂිත ගැමි, කෘෂිකාර්මිත භාණ්ඩ හුවමාරු ක්‍රමය
    (ii) පෞද්ගලික දේපොල - ලාභය - තරඟය මත පදනම් වූ මුදල් වෙළෙඳපොළ ක්‍රමය
15. ජනතා පරමාධිපත්‍යය - ව්‍යවස්ථානුකූලවාදය
    සර්වජන ඡන්දබලය - නිදහස් මැතිවරණ
    තරඟකාරී පක්ෂ ක්‍රමය

16. 1. යටත් විජිත පාලන ක්‍රමය, 2. යටත් විජිත ආර්ථික ක්‍රමය 3. යටත් විජිත දේශපාලන ක්‍රමය
4. සිවිල් හා මිලිටරි බලය 5. ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වීම

17. අභ්‍යන්තර - බාහිර

18. තෝමස් හොබ්ස් - ජෝන් ලොන් - ජීන් ජැක් රූසෝ

19. ආදි කොමියුනිස්ට් සමාජය, නවීන කොමියුනිට්ස් සමාජය

20. බෙනිටෝ මුසෝලිනී, ආඩෝල්ෆ් හිට්ලර්

## B කොටස

01. මේ ප්‍රශ්නයේ අරමුණ වන්නේ විභාග අපේක්ෂකයන් දේශපාලන විද්‍යාව යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා එය ග්‍රීක, රෝම, මධ්‍යතන, නූතන යන යුගයන් ඔස්සේ විකාශනය වූ ආකාරය ගැන හැඳින්වීමට හැකියාව ඇත්දැයි මැන බැලීමයි.

(ලකුණු 20)

02. දේශපාලන ශාස්ත්‍රීය ලෙස හැදෑරීම යනු කුමක්දැයි දක්වා එහි ප්‍රභේද 2 කෙටියෙන් හැඳින්වීම කළ යුතුය. එහිදී දේශපාලනයේ විවිධ පැතිකඩ දේශපාලන ආයතන, දේශපාලන භාවිතයන්, ආණ්ඩුකාරණය, දේශපාලන දර්යාව, දේශපාලන මතවාද කෙටියෙන් දක්වා තිබිය යුතුය. (ලකුණු 20)

03. දේශපාලන විද්‍යාවේ විෂය ත්ෂේත්‍රය යනු කුමක්දැයි දක්වා එය ග්‍රීක යුගයේ දිට අද දක්වා විවිධ තේමාවන් ඔස්සේ වර්ධනය වූ ආකාරය කෙටියෙන් දැක්විය යුතුය. එහිදී පහත තේමාවන් ගැන කෙටියෙන් දක්වා තිබිය යුතුය.
දේශපාලන දර්ශනය, දේශපාලන මතවාද, දේශපාලන න්‍යාය, දේශපාලන ආයතන, තුලනාත්මක දේශපාලනය

(ලකුණු 20)

04. අධ්‍යයන ප්‍රවේශ 4න් දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. සෑම අධ්‍යයන ප්‍රවේශයකම, හැඳින්වීම, එහි පුරෝගාමීන්, මෑතකදී යොදා ගත් අය, ප්‍රවේශයේ ලක්ෂණ, ඒවායේ ප්‍රභේද, යහපත් අයහපත් ලක්ෂණ දැක්විය යුතුය.

(එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20)

## C කොටස

05. රාජ්‍යය දේහපාලන විද්‍යාවේ කේන්ද්‍රීය සාධකය බවත් රාජ්‍ය යනු කුමක්දැයි හූන්වා රාජ්‍ය සතු කාර්යයන් කෙටියෙන් විස්තර විය යුතුය. එනම් රාජ්‍යයන් කාර්යයන්, සම්ප්‍රදායික කාර්යයන්, සමකාලීන ලෝකයේ රාජ්‍යයේ කාර්යයන් දැක්විය යුතුය. එහිදී වඩාත් හොඳ පිළිතුරක,
සමාජයේ පවත්නා බලයේ කේන්ද්‍රිය ප්‍රකාශනය ලෙත් දක්වා තිබිය හැක. ඒ කරුණු සැළකිල්ල ගෙන ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 20)

06. මේ ප්‍රශ්නයේ අරමුණු වන්නේ රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ විවිධ න්‍යායන් ඔස්සේ සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීමයිත
සමාජ ගිවිසුම්වාදය හෙවත් සමාජ සම්මුතිවාදය යටතේ රාජ්‍යයේ ප්‍රභවය, එය යොදාත් චින්තකයන්ගේ අදහස් සම්මුතිවාදය යටතේ සමාජයේ කොටස් දෙක සම්මුතිවාදයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට වූ බලපෑම විස්තර කිරීම අවශ්‍යයි. (ලකුණු 20)
මාක්ස්වාදී මතය යටතේ රාජ්‍ය ප්‍රභවය, ස්වභාවය, වර්ධනය අනාගතය ගැන අවධානය යොමු කරමින් පිළිතුර ගොඩනැංවිය යුතුය. (ලකුණු 20)

07. දක්වා ඇති රාජ්‍ය මැදිලිවලින් දෙකක් විස්තර කිරීම අරමුණ වේ.
පශ්චාත් යටත්විජිත රාජ්‍ය, නූතන ජාතික රාජ්‍ය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය සමාජවාදී රාජ්‍ය
මේවායේ, හැඳින්වීම, ඒ රාජ්‍යවල ලක්ෂණ දැක්වීම අනිවාර්ය වේ. (එක් කොටසකට ලකුණු 10 බැගින් මුලු ලකුණු 20)

08. මේ ප්‍රශ්නයේ අරමුණ වන්නේ සිසුන් හට රාජ්‍ය හා බැඳුනු සංකල්ප ගැන අවබෝධයක් ඇත්දැයි මැන බැලීමයි. එහි ඇති සංකල්ප 06ක් දැක්වීම ප්‍රමාණවත් වේ.
උදා: එම සංකල්ප හැඳින්වීම, එම සංකල්පවල පුරෝගාමී චින්තනයන්, උදාහරණ ඇත්නම් පමණක් වර්තමාන තත්ත්වය ලිවිය යුතුය. (එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20)